# යහපත් සමාජයක් උදෙසා සීගිරි ගීවලින් ලැබෙන බෞද්ධ ධර්මෝපදේශ පිළිබඳ අධ්‍යයනයක්

එස්. ඩී අනුරින් ඉන්දිකා දිවාකර[1]

## හැඳින්වීම

සිංහල රාජධානි අතර සීගිරියට හිමි වන්නේ ප්‍රධාන තැනකි. ඊට මුල් වන කරුණු අතරට සීගිරිය ගොඩනැගූ v වන කාශ්‍යප රජුගේ කලා නිර්මාණ එකතු වෙයි. ප්‍රථමයෙන් ම මේ කලා නිර්මාණවල වටිනාකම තහවුරු කළේ ඒ නිර්මාණ නැරඹීමට පැමිණි 8, 9 හා 10 සියවස්වල සීගිරි සංචාරකයන් විසිනි. එසේ සීගිරිය නැරඹීමට පැමිණි ලංකාවේ සිව් දිග සංචාරකයෝ සීගිරි මාලිගය, සිංහයා, අවට විවිධ නිර්මාණයන් ද ස්වාභාවික පරිසරය මෙන් ම විශේෂයෙන් ම සීගිරි චිත්‍ර උපයුක්ත කොටගෙන ඔවුන් සතු බුද්ධිය, දැනුම, අත්දැකීම්, ආකල්ප විවිධ කාව්‍ය ගුණයන්ට මුසු කොට රසවත් ගී නිර්මාණය කළහ. විවිධ පුද්ගලයන් විසින් නිර්මාණය කරන ලද මේ ගීවල වස්තු විෂයන් ද විවිධය. ඒ අතුරින් මේ අධ්‍යයනයට උපයුක්ත කොට ගනු ලැබුවේ ගීවල ඇතුළත් බෞද්ධ ධර්මෝපදේශයන්ය.

## න්‍යායාත්මක අවධානය හා ආනුභවික මූලාශ්‍රය

මේ පර්යේෂණය සඳහා භාවිත මූලාශ්‍ර වූයේ සෙනරත් පරණවිතානයන්ගේ *Sigiri Grafity* දෙවන කාණ්ඩයට අයත් ගී හයසිය අසූ පහය. භික්ෂූන් වහන්සේ මෙන් ම විවිධ ප්‍රදේශවලින් පැමිණි පුද්ගලයන් තමාට දැකිය හැකි දේ යොදාගෙන ද තමන් රුචි වූ වස්තු විෂයයන් ඇසුරින් මේ ගී නිර්මාණය කොට ඇත. ඒ අතුරින් මේ විමර්ශනයට භාවිත වූයේ මිනිසුන්ගේ ලෞකික මෙන් ම ලෝකෝත්තර ජීවිතයේ යහපත් පැවැත්මට කරුණු ඇතුළත් ධර්ම උපදේශ ගීය.

## ක්‍රමවේදය

බෞද්ධ දර්ශනයට අනුව බුදුරජාණන් වහන්සේ ගිහි-පැවිදි සමාජවල ලෞකික මෙන් ම ලෝකෝත්තර සුබයට අවශ්‍ය පුරුදු, පුහුණු කළයුතු විවිධ ගුණ ධර්මන් පෙන්වා දුන්හ. බුද්ධ දේශනාවල ඇතුළත් ඒ ධර්ම කරුණු සමාජ පරිණාමයන් හමුවේ යම් යම් පරිණාම ධර්මවලට හසු වුව ද දීර්ඝ කාලීනව යහපත් සමාජ ගොඩනැගීමට ඉවහල් වී ඇත. මෙහි දී ඒ ධර්ම දේශනාවන්හි ඇතුළත් ධර්ම කරුණු සීගිරි ගීවල ඇතුළත් ව ඇති කරුණු සමඟ තුලනාත්මක අධ්‍යයනයකට හසු කෙරේ.

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. anuriuok@yahoo.com

## ප්‍රතිඵල

සීගිරි ගී අධ්‍යයනයේ දී විශේෂයෙන් සීගිරි මාලිගය, සිංහයා මෙන් ම චිත්‍ර විෂය කොටගෙන ගී රචනා වී ඇති බව පෙනී ගිය ද ඒ ගී විමර්ශනයට හසු කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ යහපත් සමාජයකට අවශ්‍ය ධර්ම කරුණු ගණනාවක් පාදක කොට ගෙන මේ ගී රචනා කර ඇති බවය. එබැවින් සාහිත්‍යමය වශයෙන් නිර්මාණාත්මක ගී සමුදායක් ලෙස සීගිරි ගී පෙනී ගිය ද මිනිස් ජීවිතයට වැදගත් එමෙන් ම ජීවිතයේ යථාර්ථය හෙළිදරවු කරන හා ඒ අනිත්‍ය වූ ජීවිතය අර්ථවත් කොට ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ වක්‍ර ආකාරයකට ඉදිරිපත් කරන වැදගත් සාහිත්‍ය නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය.

## ප්‍රධාන අනාවරණය

සීගිරි ගී අධ්‍යයනයේ දී ලෞකික හා ලෝකෝත්තර වශයෙන් මිනිසාගේ ජීවිතයේ තාවකාලික සුඛය හා ස්ථිර සුඛය යන දෙවදෑරුම් අංශ සඳහා ම අවශ්‍ය වන ධර්ම කරුණු හඳුනා ගත හැකි වෙයි. වැඩි වශයෙන් ම මරණය යන ස්ථිර ධර්මතාව නිරතුරුව සඳහන් කොට ජීවිතයේ යථාර්ථය පැහැදිලි කොට ඇත්තේ කුමන වූ ද භෞතික සම්පත් නිෂ්ඵල වන බව ද හෙළිදරවු කරමිනි. ඒ කාශ්‍යප රජු ලැබූ භෞතික සුවය හා ඒ රජුගේ මරණය ඇසුරිනි. මරණය නමැති සංකල්පය උපයුක්ත කොටගෙන සැබෑ ජීවිතාවබෝධයක් ද ලැබේ. (18, 19, 22, ... කවි). ඒ ලෝකෝත්තර සුඛයේ නිත්‍ය බව ලෞකික ජීවිතයේ පවතින ශූන්‍ය බව අනිත්‍ය, ශරීරයේ වැහැරීම, ආශාවේ නිෂ්ඵල බව, සංසාරය කාන්තාරයකට සම කොට දැක්වීම, වියෝගය නිසා කනගාටුව ඇති වුවත් ශෝකය එනිසාම අනිවාර්ය බව තහවුරු කිරීම, තණ්හාව ආශාව, උඩඟු බව ජීවිත විනාශයට හේතු වන බව වැනි කරුණු දක්වා ඇත්තේ මිනිසාගේ ජීවිතයේ නිෂ්ඵලත්වය සනාථ කරමිනි (99, 118, 341 ... කවි). එමෙන් ම සීගිරි ගී කවියා කාව්‍යාත්මක කවි සංකල්පනා උපයුක්ත කොටගෙන සැබෑ ජීවිත යථාර්ථය මෙන් ම උසස් මිනිසුන් වශයෙන් සමාජයේ ජීවත් වන ආකාරය ද පෙන්වා දී තිබේ. පින් කිරීම මෙලොව පරලොව ජීවිතයේ සැපයට හේතු වන බව, එමඟින් දෙව් ලොව සැපය අත්කරගත හැකි බව, අශ්‍රද්ධාව මිනිස් ජීවිතයට වටිනාකමක් එකතු නොකරන බව, උදහස, තරහ, කෝපය උඩඟු බව ජීවිත පරිහාණිය ළඟා කරන බව, පෙර ආත්ම ඇසුරින් මතු ආත්ම ඇති බවත් එබැවින් මෙලොව, පරලොව දෙකේ ම දියුණුව සඳහා වැඩ කිරීම අත්‍යවශ්‍ය බව ප්‍රකට කිරීම, මෛත්‍රිය, කරුණාව, දයාව ජීවිතය ජය ගැනීමට උපකාර වන බව හෙළිදරවු කිරීම, කල්‍යාණ මිත්‍ර ඇසුරේ වටිනාකම පෙන්වා දීම, අන්‍ය අඩුපාඩු සෙවීම මිනිසාට සුදුසු ක්‍රියාවක් නොවන බව දැක්වීම, ධෛර්ය, ශක්තිය ජීවිතයේ ජයග්‍රහණ තහවුරු කිරීමට හේතු වනබව පැහැදිලි කිරීම, ඉවසීම, ඥානවන්තයින්ගේ ආශ්‍රය උතුම් බව දැක්වීම මිනිසාගේ ජීවිතය යහපත් කරගැනීමට බෞද්ධ දර්ශනයෙන් ලැබෙන ආලෝකයන් වන අතර සීගිරි ගීවල ද මේ පිළිබඳ ව

සඳහන්ය. (08, 98, 104, 178, 430, 450 ... ). ශීලය, ශ්‍රද්ධාව පිළිබඳ ව ද මේ ගීවල ඇතුළත් ව ඇති අතර පාපි ක්‍රියාවන්ගෙන් මිනිසා මුදවා ගන්නා උපදෙස් මාලාවක් ද ඊට ඇතුළත් වෙයි. ඒ අතර වැඩි වශයෙන් සඳහන් වන්නේ පින් කිරීමෙන් දෙව් ලොව සම්පත් හිමි වන බවත්, රූමත් වන බවත්ය (95, 143, 540 ...). එමෙන් ම ජීවිතය කාන්තරයක් බව දක්වීම, දුර්ලභ මනුෂ්‍යයත්වයෙන් ප්‍රයෝජන ගත යුතු බව පෙන්වා දීම වැනි යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති මාලාවක් සීගිරි ගීවල ඇතුළත් වන අතර නිර්වාණය ලබාගැනීමේ මූලික ක්‍රමවේදය ද සීගිරි ගීවල ඇතුළත් කොට තිබේ. ඒ අතර සියලු සතුන්ට මෙත් වැඩීම, ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුගත වීම, ත්‍රිලක්ෂණය මෙනෙහි කළ යුතු බව දක්වීම ප්‍රධානය. මෙවැනි කරුණුවලින් පෙනී යන්නේ ලද මනුෂ්‍ය ආත්මයෙන් ප්‍රයෝජන ගත යුතු බවත් සියලු දෑ අනිත්‍ය බැවින් ආශා පසෙකලා නිර්වාණය ලොව ඇති එකම සැපය බැවින් ඒ සඳහා කැපවීම අවශ්‍ය බවත් සීගිරි ගී කවීන් හඳුනාගෙන සිටි බවකි.

**සමාලෝචනය**

සීගිරි ගී යනු සීගිරියේ සෞන්දර්ය විෂය කොටගෙන ලංකාවේ විවිධ සමාජ තරාතිරම් නියෝජනය කරමින් විවිධ ප්‍රදේශවලින් පැමිණි පිරිස් විසින් නිර්මාණය කොට ඇති රසවත් ගී සමුදායකි. මේ ගී වැඩි වශයෙන් ලියැවී ඇත්තේ සීගිරි ලලනා බිතුසිතුවම් වස්තු විෂය කොටගෙනය. එසේ වුවද ඒ කාව්‍යවලින් අනාවරණ කොට ගත හැකි වැදගත් කරුණක් වන්නේ මිනිස් ජීවිතයේ සැබෑ අර්ථය ද ඒ හරහා විවරණ කොට තිබීමයි. එහි දී ගී කවීන් ලෞකික ජීවිතය ජය ගැනීමේත්, යහපත් කරගැනීමේත් ලෝකෝත්තර සුවය ලබා ගැනීමේත් මූලික ක්‍රමවේදය සීගිරි ගී ඇසුරෙන් හෙළිදරව් කළ බව සඳහන් කළ හැකිය.

**ප්‍රමුඛ පද** : සීගිරි ගී, ලෞකික, ලෝකෝත්තර, බෞද්ධ, ධර්මෝපදේශ

**ආශ්‍රිත ග්‍රන්ථ**

Pranavithana, S. (1956). *Sigiri Graffiti,* London, Oxford Univesity Press.

ජයතිලක, කේ. (1996). සීගිරි ගී නිර්මාණ. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

මුදියන්සේ, නන්දසේන. (2004). සීගිරි පද්‍යාවලිය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

විතාන, ගුණසේන. (2004). සීගිරි ගීයේ සමාජ දැක්ම, නාවල: කුරුලු පොත්.

විමලකීර්ති, මැදඋයන්ගොඩ, (1955). සිබවළඳ විනිස. කොළඹ: ගුණසේන සහ සමාගම.